**තමන්කඩුව ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවාර්තාව 2015 ජුලි 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**

**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන යටිතල පහසුකම් ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ වටිනාකම රු 13,950,000 ක් වුවද එහි අගය රු. 1,468,000 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වටිනාකම රු. 12,482,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පළාත් පාලන යටිතල පහසුකම් ව්‍යාපෘතිය යටතේ 2009 වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු. 8,200,000 ක් වටිනා බැකෝ ලෝඩර් යන්ත්‍රයේ වටිනාකම රු. 9,700,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල වටිනාකම රු. 1,500,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත්කර තිබුණු රු. 551,000 ක් වටිනා ලෝඩරයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඇ) පිළිසරු ව්‍යාපෘතිය යටතේ නිෂ්පාදිත පොහොර තොගවල වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල වලට ලැබී තිබුණු රු. 328,929 ක් වටිනා පොත් සහ හා නැතිවූ පොත්වල වටිනාකම රු.8,050 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ආදාහනාගාරය, කසල ප්‍රතිචක්‍රීකරණ ඒකකය හා සුසාන භූමි සංවර්ධනය සඳහා වැයකළ රු.949,691 ක්, වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.148,681,315 ක් වූ ගණුදෙනු විගණයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 අනුකුල නොවීම්

--------------------

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම් විගණනයේදී නිරික්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) | 132 (ඒ) වගන්තිය | අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතියක් නොමැතිව අවස්ථා 05 කදී රු.24,790 ක් වැයකර තිබුණි. |
| (ii) | 143 වගන්තිය | යම් වරිපනම් දේපළක වාර්ෂික වටිනාකමට බලපාන ලෙස එහි භෞතික වෙනස්කිරීම් කරන ලද අවස්ථාවක, එම ස්ථානය සඳහා අළුත් තක්සේරුවක් හෝ සතොයක්ෂණය කිරීමක් පිළියෙල කරනු ලැබිය හැකි වුවද, සභා බල ප්‍රදේශයේ වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව සිදුකරන ලද සංවර්ධන කටයුතු සම්බන්ධව එවැනි තක්සේරුවක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | 147 හා 149 වගන්ති | ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ වූ ඇතැම් ව්‍යාපාරික ස්ථාන වලින් බලපත්‍ර ගාසතු අයකර නොතිබුණි. |
| (iv) | 150(1) , 152(1)හා 153(1) වගන්ති | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සහ සංවර්ධනය නොකරන ලද ඉඩම් පිළිබද ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (v) | 152 (2) වගන්ති | වෘත්තිකයන්ගෙන් බදු අයකරගැනිමට අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. |
| (ආ) | තක්සේරු හා වරිපනම් බදු පනත | වසර 05 කට වරක් දේපල තක්සේරු කිරීම කළයුතු වුවද 2006 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වරිපනම් ගාස්තු අයකර තිබුණි. |
| (ඇ) | 1947 අංක 43 විනෝද බදු ආඥා පනත | අතුරු ව්‍යවස්ථා පනවා අයකරන විනෝද බදු ප්‍රතිශතය තීරණය කර නොතිබුණි. |
| (ඈ) | 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) රීති 203 සහ පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ රීති 476.1 | 2015 අප්‍රේල් මාසය අවසන් වන විටත්, භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඉ) | 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අති විශේෂ ගැසට් නිවේදනයේ 1(iii) රීතිය | ප්‍රාදේශීය සභාවට වාහනයක් නොමැති අවස්ථාවක පළාත් පාලන කොමසාරිස්ගේ අවසරය ලබාගෙන පෞද්ගලික වාහන සඳහා වියදම් දැරිය හැකි නමුත් එසේ අවසර ලබා නොගෙන අවස්ථා 03 කදී රු. 35,245 ක් වැයකර තිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-----------------------------------------<br>මු.රෙ. 571 | 2009 සිට 2012 වර්ෂය දක්වා කාලයට අදාල රු. 703,150 ක ඉකුත් තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (උ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති 1980/46 දරන චක්‍රලේඛය | සභාවට අයත් කඩ කාමර 240 ක් වෙනුවෙන් අවම වශයෙන් වසර 05 කට වරක්වත් කඩකුලී සංශෝධනය කර නොතිබුණි. |
| (ඌ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 1993 නොවැම්බර් 17 දිනැති අංක පිසී/එල්ජී/2/2/6 දරන ලිපිය | පළාත් පාලන ආයතනයේ අනුමැතියකින් තොරව සිනමා ශාලා ප්‍රවේශ පත්‍ර අලෙවි කරන ලැබූවද, ඒ පිළිබඳව අධීක්ෂණයක් කර නොමැතිවීම හේතුවෙන්, සභාවට ලැබිය යුතු වීනෝද බදු ආදායම් අහිමිවී තිබුණි. |
| (එ) | 2010 මැයි 22 දිනැති අංක පීඑෆ්/443 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ආයතන විසින් ඉන්ධන ලබා ගැනීමේදී මාසික ඉන්ධන අවශ්‍යතාවය අනුව අදාල සමුපකාර සමිති වෙත තැන්පත් මුදලක් තබා, එම සමිතිය සතු ඉන්ධන පිරවුම්හල් වලින් ඉන්ධන ලබාගැනීමට ක්‍රියා කළ යුතු වුවත්, ඊට පටහැණිව පෞද්ගලික ඉන්ධන පිරවුම්හල් වෙත ඉන්ධන අත්තිකාරම් ලබාදී සමාලෝචිත වර්ෂය තුළදී රු.6,583,384 ක ඉන්ධන මිලදී ගෙන තිබුණි. |

**02. මූල්‍ය සමාලෝචනය.**

--------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,278,191 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 8,001,848 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

---------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ------------------ | -------------------- | ---------- | ---------------------- |
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 6,956 | 8,080 | 5,815 |
| (ii) බදු කුලී | 20,070 | 16,273 | 3,067 |
| (iii) බලපත්‍ර ගාස්තු | 4,205 | 4,571 | - |
| (iv) වෙනත් ආදායම් | 150,701 | 72,819 | 77,633 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුනු උසාවි දඩ රු. 5,727,487 ක්ද, මුද්දර ගාස්තු රු .10,533,200 ක්ද විය.

2.2.3 කඩ කාමර බදු

--------------------

(අ) සභාවට අයත් කුලියට දී ඇති කඩ කාමර සංඛ්‍යාව 240 ක් වන අතර මෙම කඩ කාමර ලබාගත් අයවලුන් විසින් අදාල කුලී ගිවිසුමට පටහැනිව, අතුරු බදුදීම් සිදුකරනු ලබන බව 2015 ජුනි 24 දින කරන ලද සෝදිසි පරික්ෂාවේදී අනාවරණය විය. එහෙත් සභාව විසින් මෙවැනි අතුරු බදුදීම් හදුනාගෙන, අදාල ගිවිසුම් අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමර වලට අදාල බදු කුලී ගිවිසුම් අනුව වාරික 03 ක් හිඟ හිටින අවස්ථාවලදී, අදාල කඩ කාමර සභාව වෙත ආපසු පවරා ගෙන ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වුවත්, සභාවට අයත් කඩ කාමර 108 කින්, සභාවට අයවිය යුතුව තිබුණු රු. 657,190 ක කුලී මුදල් හා රු. 207,906 ක හිඟ එක්වත් මුදල් අයකර ගැනීමට වර්ෂ ගණනාවක් ප්‍රමාද කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

---------------------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) බැංකු ගිණුම් 3 කට අදාල රු. 1,025,805 ක ශේෂයක් වර්ෂය පුරාම නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) පළාත් පාලන යටිතල පහසුකම් ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේදී ඉදිකරන ලද රු. 33,957,267 ක් වටිනා පුස්තකාල ගොඩනැගිලි 02 ක්, සමාලෝචිත වර්ෂයේදී අදාල අරමුණ සඳහා යොදවාගෙන නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පාලනය

------------------------

(අ) පළාත් පාලන යටිතල පහසුකම් ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2010 වර්ෂයේදී ඇති කරගන්නා ලද කොන්ත්‍රාත් ගිවිසුමකට අදාල කොන්ත්‍රාත් කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පත්කරන ලද උපදේශන සමාගමකට, ගිවිසුම් පරිදි ගාස්තු නොගෙවීම නිසා පවරන ලද නඩුවක් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී නඩු ගාස්තු වශයෙන් රු. 52,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ තමන්කඩුව ප්‍රාදේශීය සභාව, පළාත් පාලන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සමඟ එක්ව ප්‍රාදේශීය සභා මාර්ග සංවර්ධන ව්‍යාපෘති 6 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2010 අගෝස්තු 02 දින රු.53,107,118 ක මුදලකට ගිවිසුමකට එළඹ තිබුණි. කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු. 9,655,839 ක අත්තිකාරම් මුදලින් රු. 6,546,030 ක අත්තිකාරම් පියවාගැනීමට කටයුතු කර නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් කටයුතු ඉටු නොකරන ලද කොන්ත්‍රාත්කරුට එරෙහිව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි. කොන්ත්‍රාත් කටයුතු අධීක්ෂණය සඳහා පත්කරන ලද ආයතනයට ගෙවන ලද රු. 8,141,056 ක අධීක්ෂණ හා නිර්මාණ සැලසුම් ගාස්තු වලින්, ඉදි නොකරන ලද මාර්ග 3 ක් හා ඉතිරි මාර්ග 3 හි ඉටු නොකරන ලද වැඩ කොටස් වලට අදාලව ගෙවන ලද ගාස්තුවද නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් කටයුතු පැහැර හැරීම නිසා ඉහත සඳහන් රු. 6,546,030 ක අත්තිකාරම් මුදලට අදාල කාර්ය සාධන බැදුම්කරයේ මුදල් ආපසු ලබාගැනීම සඳහා 2012 අප්‍රේල් 20 දින බොරැල්ල ලංකා බැංකුවේ දෙවන ශාඛාවේ කළමනාකරු වෙත තමන්කඩුව ප්‍රාදේශීය සභාව විසින් ඉල්ලීමක් කර තිබියදී කොන්ත්‍රාත්කරු විසින් ඒ සම්බන්ධව බස්නාහිර පළාත්බද වානිජ අධිකරණයේ නඩුවක් පවරා අදාල ගෙවීම් අත්හිටුවීමට කටයුතු කර තිබුණි. එහෙත් 2013 ජුනි 28 දින ලබාදුන් නඩු තීන්දුව අනුව, සභාව වෙත අදාල මුදල ආපසු ලබාගැනීමේ අවස්ථාව උදාවී තිබුණු නමුත් කාර්ය සාධන බැඳුම්කරයේ වලංගු කාල සීමාව ඉක්මවීමේ දිනය වූ 2013 ජුලි 31 දින අවසන්වීමට පෙර අදාල බැඳුම්කරයේ මුදල් ආපසු අයකර ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් අදාල බැංකුව වෙත යොමුකිරීමට අසමත්වී තිබුණි. මෙම නඩුව සම්බන්ධව කටයුතු කිරීමට තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ වගකිව යුතු විෂයභාර නිලධාරියෙකු පත්කිරීමත්, නීති කටයුතු සඳහා නීතීඥවරු පත්කර ගැනීමත්, නඩු දින වකවානු පිළිබඳ අවධානයෙන් සිටීමත්, නඩුව සම්බන්ධව සභාව දැනුවත් කර සභා තීරණ ලබාගැනීමත් සිදුවී නොතිබීම සම්බන්ධයෙන් සභාවේ ලේකම්, සභාපතිවරයා හා අනෙකුත් වගකිව යුතු නිලධාරීන් නොසැලකිලිමත් ලෙස කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

(අ) සභා තීරණ අනුව බාහිර පාර්ශවයක් වෙත පෙර පාසලක් පවත්වාගෙන යාම සඳහා සභාවට අයත් ගොඩනැගිල්ලක් ලබාදිමේදී ඊට අදාල පාර්ශවය සමඟ ගිවිසුමක් ඇතිකර ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් කදුරුවෙල නගරයේ පිහිටි මාසික කුලිය රු. 35,000 ක අගයකට ලබාදී තිබුණු ගොඩනැගිල්ල, සමාලෝචිත වර්ෂයේදී කඩා ඉවත්කර ඇතත්, ඒ සඳහා පිළිගත හැකි හේතූන් ඉදිරිපත් නොවුණි. තවද මෙම ගොඩනැගිල්ල 2012 වර්ෂයේදී ටෙන්ඩර් කර රු. 14,000,000 කට ලබාදී ඇතත්, අදාල මුදල සමාලෝචිත වර්ෂයේදී ටෙන්ඩර්කරුට ආපසු ලබාදී තිබුණි. මෙම ටෙන්ඩර් පිරිනැමීමේදී ඇති කරගත් ගිවිසුම, ටෙන්ඩර් මුදල් ආපසු ගෙවීමේදී අවලංගු කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණු අතර ගොඩනැගිල්ල කඩා ඉවත්කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවට අහිමිවූ ආදායම රු. 1,260,000 ක් විය.

3.4 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන්හි සභාව තුළ අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින්ද ප්‍රමාණවත් විගණනයක් සභාව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය